www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නිවාස විනාශ කිරීමට එරෙහිව නිවැසියෝ විරෝධතා දක්වති

## Sri Lanka: Residents protest against demolition of homes

අපගේ වාර්තාකරුවන් විසිනි

2010 මැයි 15

මිලිටරිය විසින් තම නිවෙස් විනාශ කිරීමට එරෙහිව 200ක පමන පිරිසක් ඊයේ කොලඹ, කොම්පඤ්ඤවීදියේ විරෝධතාවක් පැවත් වූහ. වැඩිමනක් අය මුස්ලිම් වූ පවුල් 45ක් ජීවත් වූ නිවාස 20ක් පසුගිය සිකුරාදා බුල්ඩෝසර් කරනු ලැබුවේ ආරක්ෂක අමාත්‍යාංශයේ ආඥාවන්ට අනුවය.



මැතම නෙරපීමට එරෙහි උද්ඝෝෂනය

තම නිවෙස් සුන්බුන් බවට පත්කිරීමෙන් කුපිත වූ නිවැසියන් මෙල්ල කිරීමට පොලිස් නිලධාරීන් සහ හමුදා සොල්දාදුවන් සිය ගනනක් පසුගිය සති අන්තයේ බලමුලු ගන්වා තිබුනි. ජනයා ආන්ඩුවේ ක්‍රියාවට විරෝධය පැවිට, කැරැලි මර්දන පොලිසිය බැටන් ප්‍රහාර එල්ල කර ඔවුන් පලවා හැරියෝය.

කොලඹට යාබද තොටලඟ ඉදිකරන ලද තාවකාලික පැල්පත්වල පදිංචි වෙන ලෙස ආන්ඩුව විසින් කරන ලද නියෝගය පීඩාවට පත් පවුල් විසින් නොතකා හලේය. ඒ වෙනුවට, තම පැරනි නිවෙස් පිහිටි ස්ථානය ඉදිරියේ ඉදිකරගත් කුඩාරම්වල ඔවුන් ජීවත් වෙති. ලමුන්ගේ පාසැල් පොත් සහ ඇඳුම් ඇතුලු තමන් සන්තක දේවල් බොහෝ දෙනෙකුට අහිමි කෙරින. දැන් ඔවුන් රැකෙන්නේ අසල්වැසියන්ගේ සහ සුභසාධක සංවිධානවල ආධාර මතය. ඔවුන්ගේ නිවෙස් ඉදිකර තිබූ භූමිය සමතලා කොට තිබෙන අතර එය තහඩු වැටකින් ආවරනය කොට "තහනම් ප්‍රදේශයක්" ලෙස නම් කර තිබේ.

නිවැසියෝ ඉවත් වීම ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව, නාගරික සංවර්ධනය අධිකාරිය (යූඩීඒ) විකල්ප නිවෙසක් වෙනුවෙන් වාර්ෂික කුලිය ලෙස රුපියල් ලක්ෂයක් (එක්සත් ජනපද ඩොලර් 880ක්) එක් එක් නිවෙස් හිමියාට ගෙවීමට පොරොන්දු විය. කෙසේ නොහ්, අකමැත්තෙන් එයට කැමති වූ නිවැසියන් මුදල් ලබා ගැනීමට යූඩීඒ කාර්යාලයට ගිය විට ඔවුන්ගේ භාන්ඩ ප්‍රවාහනය කරවා ගැනීමට එක් නිවසකට රුපියල් 5000ක් පමනක් ලබා දී තිබේ.

මහජනයා ඊයේ නාකපන වැස්සේම ජනාධිපති රාජපක්ෂගේ ආන්ඩුවට එරෙහිව සටන් පාඨ කියමින් විරෝධතා දැක්වූහ. ඔවුහු, "අපේ නිවෙස්වලට අත නොතබව්!", "අපේ ලමයි මහපාරේ!", "රාජපක්ෂගේ යහපාලනය මේකද?" සහ "සංවේදී නායකයා බුදී" යනාදි සටන් පාඨ කියමින් විරෝධතා පාඨ රැගත් සටන් පුවරු ප්‍රදර්ශනය කලහ. විරෝධතාව නැවත්වීමට පොලිස්භටයන් සියගනන් යොදවා තිබූ අතර තවත් විශාල පොලිස් භට කන්ඩායමක් යාබද ප්‍රදේශයේ පෙලගස්වා තිබුනි.

පසුගිය මාසයේ ඔහුගේ නව ආන්ඩුව පත් කල වහාම, රාජපක්ෂ විසින් නාගරික සංවර්ධන අධිකාරිය ආරක්ෂක අමාත්‍යාංශයේ පාලනය යටතට පත් කලේය. ජනාධිපතිගේ එක් සොයුරෙකු වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සඳහන් කලේ, කොම්පඤ්ඤ වීදියේ පැල්පත් "අශෝභන දසුනක්" වනු ඇති හෙයින් ඒවා ඉවත් කල යුතු බවයි. සංවර්ධනය සඳහා ඉතා

වැදගත්වන භූමිය නිදහස් කර ගැනීමට ආන්ඩුව වැයම් කරමින් සිටී. ගොඩනැගීමට අපට ඉඩ දෙන්න බෑ. මේක විනාශකාරී සංවර්ධනයක්"යැයි කීවේය.




**පොලීසිය උද්ඝෝෂනයට බාධාකරයි**

ඊයේ පැවති විරෝධතාව කැඳවා තිබුනේ, "කොලඹ පුරවැසියන්ගේ නිවාස සුරැකීමේ පදනම" විසිනි. විපාක්ෂික එක්සත් ජාතික පක්ෂය (යූඇන්පී), ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය (ශ්‍රීලමුකො), ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ නව සමසමාජ පක්ෂය (නසසප) යන පක්ෂ විසින් කන්ඩායම සංවිධානය කර තිබින.

"ජනතාව ඉවත් කොට දමා තිබෙන ආකාරය නින්දාසහගතයි. මාස දෙකක් තියා අඩු ගානේ එක මාසයක්වත් කල් දිය යුතුව තිබුනා", යැයි කියමින් ශ්‍රීලමුකොසයේ නායක රවුෆ් හකීම් කන්ඩායම නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව සඳහන් කලේය. පැල්පත් වැසියන් බොහෝ දෙනෙකු පසුගිය මස පාර්ලිමේන්තු මැතිවරනවලදී යූඇන්පියට ඡන්දය ප්‍රකාශ කිරීමට පලිගැනීමක් වසයෙන් ගෙවල් විනාශ කිරීම සිදුව ඇතැයි යූඇන්පී පලාත් සභා මන්ත්‍රී මුජිබර් රහ්මාන් කියා සිටියේය.

නසසප නායකයෙක් වන වමිල් ජයනෙත්ති තියුනු වාචාලත්වකින්, "මේක මහින්ද චින්තනේ නෙවෙයි, මහින්ද නීච චින්තනේ. මහින්ද චින්තනේ පලවා හැරීමේ පලමු වෙඩි පහර කොම්පඤ්ඤ වීදියේ පත්තු කල බව අපි කියනවා. මේ විධියෙන් මේ රට

මේ සියලුම කටමැත දෙඩීම් තිබියදීත් නිවාසවලින් පන්නා දැමුවන්ගේ යහපත් නිවාස මෙම භූමියේම යලි ගොඩනගන්නැයි එකද කරීකයෙක්වත් ඉල්ලා සිටියේ නැත. නිවෙස්වලින් ජනතාව ඉවත් කිරීම සිදුවිය යුත්තක් වසයෙන් ද සහ "නීති විරෝධීව අත්කරගත්" ඉඩම්වලින් පැල්පත් වැසියන් නෙරපා දැමීම ආන්ඩුවේ "අයිතියක්" යැයි ද ඔවුහු වක්‍රව පිලිගත්හ. නීතිමය ක්‍රියාමාර්ගයකට මුලපුරන්නේ නම් එහි අරමුන වනු ඇත්තේ කෝපහරිත නිවැසියන් අස්වසාලීමට සුලු සහනයක් ලබා ගැනීමය.

යලි වතාවක් වඩාත් ද්‍රෝහී භූමිකාව රඟ දක්වමින් සිටින්නේ, ආන්ඩුවට එරෙහිව යහපත් සහ අඩු කුලී නිවාස වෙනුවෙන් මොනයම්ම හෝ ස්වාධීන දේශපාලන අරගලයක් අවහිර කිරීමෙහිලා සිංහල අන්තවාදී ජවිපෙ සහ දක්ෂිනාංශික යූඇන්පිය සමග එකට අත්වැල් බැඳගත් නසසපයේ හිටපු රැඩිකලුන් විසිනි. යූඇන්පිය එය බලයේ සිටින විට කොලඹ ප්‍රදේශවලින් නිවැසියන් නෙරපා තිබෙන අතර එය මූලික ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් වෙත ප්‍රහාර එල්ල කිරීමෙහිලා දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියයි.

කොම්පඤ්ඤ වීදියේ නිවැසියන් ඉවත් කිරීම වනාහි පැල්පත් වාසීන් සුවිසල් සංඛ්‍යාවක් පලවා හැර

එමගින් කොලඹ නගරය මධ්‍යයෙන් මුදා ගන්නා අක්කර 1000ක් වූ මිල අධික අනර්ඝ භූමි ප්‍රමාණය ආයෝජකයන් මගින් සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන ආන්ඩුවේ පුලුල් සැලැස්මක කොටසකි. එමෙන් ම යූඩීඒ මෙයටම සම්බන්ධව පදික වෙලෙන්දන් දහස් ගනනක් එලවා දැමීමේ මෙහෙයුමක් ද දියත් කර තිබේ.

අන්ත දරිද්‍ර සහ සමාජයේ වඩාත් පීඩාවට පත්වෙන වැසියන්ට එරෙහිව එල්ල කෙරී ඇති මෙම මෙහෙයුම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉල්ලා සිටින දරුනු කප්පාදු ක්‍රියාමාර්ගයන් ක්‍රියාවට දැමීමේ දී සමස්ථ කම්කරු පන්තියට එරෙහිව යොදාගනු ඇති විධික්‍රම පිලිබඳ අනතුරු ඇඟවීමකි.

කම්කරුවන් කොම්පඤ්ඤ වීදියේ පැල්පත්වලින් පලවා හරින ලද අය ආරක්ෂා කරගැනීමට පෙරට ආ යුතුය. භූමියට හිමිකම් කියන ප්‍රාථමික නෛතික ලියවිලි ඔවුන්ට නොතිබුන ද බොහෝ අය දශක ගනනාවක්, සමහර අය පරම්පරා ගනනාවක් මෙම ප්‍රදේශයේ ජීවත් වූවෝය. ජීවත් වීමට සුදුසු වාසස්ථාන ද විදුලිය, පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව වැනි අත්‍යාවශ්‍ය සේවාවන් ද නොමැතිව දිවයින පුරා ජීවත් වන කම්කරු ජනතාව මුහුන දෙන ගැටලු වලට සමාන ගැටලු වලට ඔවුහු ද මුහුන දෙති.

දේපල වෙලඳාම්කරුවන්ට මාවත පාදා දීමට ආන්ඩුව මෙම පැල්පත් කුඩුපට්ටම් කල ආකාරයෙන්ම, ගෝලීය මූල්‍යමය වෙලඳපොලේ ඉල්ලීම් සන්තර්පනය කිරීමට රාජ්‍ය වියදම් සහ අත්‍යාවශ්‍ය සේවාවන්ට කෙටීමට ලකලැහැස්ති වෙමින් සිටියි. තම නිවෙස්වලින් මහපාරට ඇද දැමූ පවුල්වල අයිතීන් සුරක්ෂිත කරගැනීමේ එකම මාවත වැටී ඇත්තේ ධනවත් සුලුතරයකගේ පෞද්ගලික ලාභය උදෙසා නොව බහුතරයකගේ අවශ්‍යතා සපුරාගැනීමට සමාජවාදී වැඩපිලිවෙලක් මත පදනම්ව රාජපක්ෂ ආන්ඩුවට එරෙහිව දේශපාලන අරගලයක් ඔස්සේය.

එවැනි අරගලයක ආරම්භක ලක්ෂ්‍යය වන්නේ යූඇන්පිය, ජේවීපිය සහ කම්කරු පන්තිය බංකොලොත් ලාභ පද්ධතියට ගැට ගසා තබන හිටපු-වම්මුන් ඇතුලු ධනපති පන්තියේ සියලුම පක්ෂ වලින් ස්වාධීනව පැල්පත් සහ කම්කරු පන්තික පෙදෙස්වල ක්‍රියාකාරී කමිටු ගොඩනැගීමට කරන අරගලයකි. සමාජවාදී සමානතා පක්ෂය විසින් යෝජනා කරන වැඩ පිලිවෙල වන්නේ එයයි.

නිවෙස්වලින් එලියට දැමූ ඇතැම් අය ද ඇතුලුව කොම්පඤ්ඤ වීදියේ නිවැසියන් වෙත ලෝක සමාජවාදී වෙබ් අඩවියේ වාර්තාකරුවෝ කතා කලහ. විවාහක ස්ත්‍රියක් සඳහන් කලේ, "යූඩීඒ එකෙන් තොටලඟ දීපු ගෙවල් බාරගන්න අපිට බෑ. ඇත්තටම ඒවා ගෙවල් කියලා කියන්න බෑ. ඒවා හරියටම මඩගොඩේ අටවපු ලැලි පෙට්ටි. හොඳ වාතාශ්‍රයක් එහි නෑ. කානු උතුරලා ගලනවා. කුනු ගඳ උහුලන්න බෑ. අපි ජීවත් වෙච්ච ගෙවල් මෙයිට වැඩිය සියගුනයක් හොඳ වෙච්චි අපි මොකද එහෙට යනවද? අපි යන්නෙ නෑ කියලා තීරනය කලා"යනුවෙනි.

තවත් ගෘහනියක් මෙලෙස අදහස් දැක්වූවාය: "ගමකවත් රුපියල් ලක්ෂයක් හයමාසෙක කුලියට මදි. ඒ වගේම කුලී ගෙදර කොච්චර කාලයක් අපිට ජීවත් වෙන්න වෙයිද කියලා අපි දන්නේ නෑ. ඔවුන් අපිට ගෙවල් හදලා දෙයි කියලා මොනම විස්වාසයක්වත් අපට නෑ."

ගෙවල්වලින් එලියට ඇද දැමීමේ මෙහෙයුමේ ම්ලේච්ඡත්වය පිලිබඳ තරුන මවත් විස්තර කලාය. ඇගේ දුව පොත් එලියට ගැනීමට තැත් කරන විට පොලිසිය ඇයට පහර දුනි. "පිටමං වෙලා යන්න ඔවුන් අපට දුන්නේ පැයක් විතරයි," ඇය කීවාය. "එයින් පස්සේ ඔවුන් ඉතා අමානුෂික විදියට අපේ මිනිසුන්ට පහර දෙන්න පටන් ගත්තා. මහල්ලෝ ද ලමයි ද කියලවත් ඔවුන් සැලකුවේ නෑ. එතකොට දැන් අපිට හිතා ගත්තහැකි යුද්ධය වෙලාවෙ ඔවුන් උතුරෙ මිනිසුන්ට සැලකුවේ කොහොමද කියලා."

2008 වසරේ කොම්පඤ්ඤ වීදියේ ග්ලෙන් වීදියෙන් ජනයා පලවා හරින විට එකී තීරනය පුරවැසියන්ගේ ආරක්ෂාව ආන්ඩුව කියා පෑවේය. එක් නිවැසියෙක් ආන්ඩුව කී දේ සිහිපත් කලේය. "එල්ටීටීඊ එක ගුවන් හමුදා කඳවුරට ගහන්න ඉඩ තියෙනවා, එවිට යාබද වෙසෙන සිවිල් වැසියන්ට හානි වෙන්න පුලුවන් කියලා ඔවුන් කිව්වා. අපි ගැන කොයිතරම් කැක්කුමක්ද! දැන් යුද්ධය ඉවරයි, එල්ටීටීඊ එක තවදුරටත් නෑ. හමුදාවයි පොලිසියයි තමයි අපිට දරුනු විදියට පහර දුන්නේ, එල්ටීටීඊ එක නෙවෙයි."



**ලෝසවෙඅ 2008 නිවාසවලින් නෙරපූවන් සමග කතා කරයි**

කොම්පඤ්ඤ වීදියේ හිටපු නිවැසියන්ට තොටලඟ ලබා දුන් "සංක්‍රමනික වාසස්ථාන"නිරීක්ෂනය කිරීමට ලෝසවෙඅයේ කන්ඩායමක් ගියේය. කුටිවල සහ ඒවායේ අවට තත්වය නෙරපා දැමූවන් විස්තර කලාටත් වඩා අන්ත විය. ග්ලෙන් වීදියෙන් පිටමං කල පවුල් 73ක් මඩ වගුරක් වැනි තැනක ලැග සිටිති.

ආන්ඩුව ඔවුන් නීති විරෝධී නිවැසියන්යැයි පවසන බැවින් ඔවුන්ට නිවාස ලැබී නැත. "ආන්ඩුවේ බොහෝ දේශපාලඥයින් අලුත් ගෙවල් අපට දීමට පොරොන්දු වෙලා තියෙනවා. ඒත් මුලුමනින්ම අවුරුදු දෙකකට පස්සෙත් අපි ජීවත් වෙන්නේ අපායක," ගෘහනියක් කීවාය.

© www.wsws.org